


අනුකි සෙනායා ඒකනායක

4 A

I

කෘතියේ නම: දේදුන්නට පාට ලැබුණු හැටි

කතෘගේ නම: අනුකි සෙනායා ඒකනායක

කතෘගේ වෙනත් කෘති :

- ආඩම්බර රෝස මල
- හිතුවක්කාර කුරුලු පැටියා
- ලුමිණි සහ ආච්චි
- මා සමඟ ගස් මල්
- මල්ලී පුදුම වෙලා

කෘතිය පළකරන දිනය: 2025.02.08

ISBN අංකය: 978-624-208-649-1

දු.ක. අංකය :- 077-5088586

# පිදුම

මා ඇති දැඩි කරමින් පාසල් යවන මගේ ආදරණීය
අම්මාටත්, අප්පච්චීටත්....

මට අකුරු කියාදෙන ආදරණීය ගුරු
දෙමාපියන්ටත් ....

හොඳ දේ කියා දෙමින් මා ආදරයෙන් රැක බලා
ගන්නා ආච්චීටත්, අත්තම්මාටත්, අත්තාටත්,
දිව්‍යලෝකයේ සිටින සීයාටත් ....

දඟ වැඩ කළත්, රණ්ඩු කළත් මට ආදරේ මගේ
පුංචි මල්ලීටත් ....

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

එකෝමත් එක රටක දේදුන්නක්

සිටියා. හැබැයි එයා කැතයි.

ඇයි දන්නවද? එයාට දේදුන්නක

තිබෙන පාට 7 නැති නිසා.

දවසක් දා එයා උදෙන් ම අහස්

පාසලට ගියා. එයාගේ පන්තියේ

හැමෝට ම පාට 7 ම තිබ්බා.

එයාටදුක හිතුණා. එයා ගෙදර

ආවෙත් අඩාගෙන.



දේදුන්නගෙ අම්මා :-

මේක නම් හරියන වැඩක්
නෙවෙයි හැමදාම අපේ දුව
අඬාගෙන එන්නේ
අපි මේකට මොකක් හරි කරන්න
ඕනේ
අනික හෙට දුවගෙ උපන්දිනේනේ

දේදුන්නගේ තාත්තා (ඉර):-

පොඩ්ඩක් ඉන්න මට හොඳ අදහසක්
ආවා අපිට පුළුවන්නේ සිනාවයි
මිනාවයි හෙට උදෙන්ම පාට හොයන්න
එනකන් පෘතුවියට යවන්න

වැහි වළාකුළ :-

ඒක නම් හොඳ අදහසක්(උදේ වුනා)



මිනා :-
අම්මෝ සිනා මේ පැත්තට අවේ
ගොඩ කාලයකින් මට ටිකක්
කැරකිල්ල වගේ

සිනා:-
ඔව් අනේ මටත් කැරකිල්ල වගේ
(ටික කාලයක් ගත වූ පසු)

මිනා :-
දැන් නම් අපි යං පාට හොයන්න

සිනා:-
හා අපි යං
(ටිකක් දුර ඇවිදූ පසු)

මිනා:-
ඒයි සිනා පොඩ්ඩක් ඉන්න මට
රතු පාට වද මල් හම්බුණා අපි ඒක
රතු පාටට ගමු
සිනා:-
හා



දේදුන්නා:-

අම්මේ තාත්තේ කෝ සිනයි මිනයි

තාත්තා(ඉර):-

පුතේ ඒ දෙන්නා පොඩි වැඩකට
ගියා ඒ ගොල්ලෝ පස්සේ එයි

දේදුන්නා:-

හා අම්මේ හා ත්ත්තේ මං
ඉස්කෝලේ ගිහින් එන්නං බායි

ඉර හා වැහිවළාකුළ:-

(දේදුන්න දැනගෙන හිටියේ නෑ
එයාගේ උපන් දිනය කියලා ඒ
අතර සිනාටයි මිනාටයි තෑඹිලි
පාට රෙදි වැලක් හම්බුණා)



(රෙදි තිබ්බේ නෑ)

මිනා :- සිනා මම නම් හිතන් නෑ මේ රෙදි වැල ගලවන්න පුළුවන් කියලා අපි වෙන එකක් තැඹිලි පාටට ගමු.

සිනා :- උත්සහය අත හරින්න හොඳ නෑ අපි යං අදින්න.

මිනා :- හා එහෙනං

(මේ ගොල්ලෝ රෙදි වැල අදින අතර උකුස්සෙක් කුරුල්ලෙක් පන්න පන්න ඉද්දි කුරුල්ලා උකුස්සා එනකල් ටිකක් විවේක ගත්තා. ඊට පස්සේ උකුස්සා කුරුල්ලා කියලා රෙදි වැල අරං ගියා ඊට පස්සේ උකුස්සා බර නැත්තේ ඇයි කියලා බැලුවා. රෙදි වැලත් තියන නිසා කහ පාට දෙහි ගහක කුරුමිට්ටෝ ඉන්න රෙදි වැල තියලා ගියා.)



(කුරුමිට්ටෝනුත් ගහේ ටිකක් විවේක
ගත්තා ඊට පස්සේ රෙදි
වැල තැඹිලි පාටට දෙහි ගෙඩි කහ
පාටට දෙහි පතු කොළ
පාටට ගත්තා. ඒ ගොල්ලොත් ගගේ
රූටලා ගිහින් ඉතුරු පාට
ටික හොයන්න ගියා. ඒ ගොල්ලෝ
නිල් පාටට නිල් කටරොඩු
මල් ගත්තා. ඒ ගොල්ලෝ පොකුනක
තිබිලා දම් පාට නෙළුම්
මලකුත් නෑ මේ ගොල්ලෝ දුක් වුණා.t)



(ටික දුරක් යද්දී ගොඩාක් ලස්සන මැජික් කුමාරිකාවක් මේ ගොල්ලො දැක්කා. මේ ගොල්ලෝ රූටලා උඩට උඩට ආවා මේ ගොල්ලෝ එයාට කතා කරා ඒත් ඇහුනේ නැති නිසා මේ ගොල්ලෝ කන ලඟට ගිහින් මෙහෙම කිව්වා)

සිනා මිනා :-

අපිට ඉන්ඩිකෝ පාට දෙනවද ඔයා ඉල්ලන ඕනෑම දෙයක් දෙන්නං.

(කුරුමිට්ටන් අහසේ ඉදන් අවේ කියලා දැනං හිටියා.)

මැජික් කුමාරිකාව :-

මට වළාකුලක් ඕනේ

සිනා මිනා :- ආ ගන්න

මැජික් කුමාරිකාව :-

ආ ඉන්ඩිගෝ පාට වතුර

(මේ දෙන්නා ස්තුති කරලා ආපහු අහසට ආවා.)



දේදුන්නත් අහස් ඉස්කෝලේ ඇරිලා

ආවා. දේදුන්න එයාගේ

උපන් දිනය ගැන මොනවත් දැනගෙන

හිටියේ නෑ. ඉර අර පාට

දියර කරන්න ගත්තා. නැත්තං දේදුන්නට

පාට ගැහුවාට.

තියෙන නැති නිසා දේදුන්න ගෙදර ආවා.

එක පාරට ම පාට

ටික කුරුමිට්ටෝ එයාගේ ඇගට ගැහුවා.

එතකොට ඒ ගොල්ලෝ

දේදුන්නගේ නවවෙනි උපන් දිනය

සැමරුවා. දේදුන්න රන් තැඹිලි

කඩන කොල්ලා නිල් ඉරක් දකියි කියලා

කිව්වා.



දේදුන්න :- බොහොම ස්තූතියි
හැමෝමටම මට පාට හත ම
දීලා මගේ දුක අයින් කරලා මාව
පුදුම කරාට.

දේදුන්න හැර උදව් කරපු හැමෝම :-
ඒක අපේ යුතුකමක්.

දේදුන්න
මේ උපන් දිනය මට අමතක
වෙන්නෙ නෑ.

නිමි................



පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2025.02.08